# 2557 - මූලික පිරිවෙන් වර්ෂාවසාන පරීක්ෂණය - 2013

**3 ශ්‍රේණිය** **(07) ඉතිහාසය** **පැ තුනයි**

* I කොටසේ ප්‍රශ්න සියල්ලටත්, II කොටසින් තෝරාගත් ප්‍රශ්න **හතරකටත්** පිළිතුරු ලියන්න.

## I කොටස

01. කෙටි පිළිතුරු ලියන්න.

i. ක්‍රි.ව.1880 දී ලංකාවට පැමිණි ඇමරිකන් ජාතික හෙන්රි ස්ටීල් ඕල්කට් තුමා ආරම්භ කළ ආයතනය නම් කරන්න.

ii. ජාතික ගීය රචනා කළේ කවුරුන් විසින් ද?

iii. ලංකාවේ පැරණිතම වංශ කතාව කුමක් ද?

iv. ලංකාව පාලනය කළ අනුරපුර යුගයේ රාජ වංශ **දෙකක්** නම් කරන්න.

v. 'ආලකමන්දාවක්' වැනි සීගිරිය ගොඩනැංවූ රජතුමා කවුද?

vi. පැරණි ලක්දිව පැවති ප්‍රධාන වරායන් **දෙකක්** නම් කරන්න.

vii. පොළොන්නරු යුගයේ සිටි පාලකයන් දෙදෙනෙකු සඳහන් කරන්න.

viii. ශ්‍රී ලංකාව අවසන් වරට එක්සේසත් කළ කෝට්ටේ යුගයේ සිටිපාලකයා කවුද?

ix. 'ත්‍රිපිටකය' ග්‍රන්ථාරූඪ කළ ස්ථානය සඳහන් කරන්න.

x. ක්‍රි.ව.1873 සහ 1875 වර්ෂවල ආරම්භ කළ සුප්‍රකට පිරිවෙන් **දෙක** සඳහන් කරන්න.

(ලකුණු 2x10 = 20)

## II කොටස

02 i. ඉතිහාසය හැදැරීමේ දී උපකාරී වන ප්‍රධාන මූලාශ්‍ර වර්ග 02ක් නම් කරන්න. (ලකුණු 03)

ii. 'නානක' විද්‍යාව යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද? එය අපට වැදගත් වන්නේ ඇයි? (ලකුණු 04)

iii. ශ්‍රී ලංකාවට සංක්‍රමණය වූ මුල්ම ආර්ය කණ්ඩායම් නම් කර, ඒ පිළිබඳ හැඳින්වීමක් කරන්න. (ලකුණු 08)

03 i. අනුරාධපුර යුගයට අයත් පිරිවෙන් **තුනක්** නම් කරන්න. (ලකුණු 03)

ii. කෝට්ටේ යුගයේ පැවත් ප්‍රධාන පිරිවෙන් **හතරක්** නම් කරන්න. (ලකුණු 04)

iii. වැලිවිට ශ්‍රී සරණංකර සංඝරාජ මාහිමිපාණන් වහන්සේගෙන් ඉටු වූ ශාසනික මෙහෙය පිළිබඳ විස්තරයක් කරන්න. (ලකුණු 08)

04 i. ලෝකයේ පැරණිතම ගංගා නිම්න ශිෂ්ටාචාර 03 නම් කරන්න. (ලකුණු 03)

ii. ශිෂ්ටාචාරයක තිබිය යුතු ප්‍රධාන ලක්ෂණ 04ක් සඳහන් කරන්න. (ලකුණු 04)

iii. ඔබ කැමති ශිෂ්ටාචාරයක ආගමික විශ්වාස පිළිබඳ විස්තරයක් කරන්න. (ලකුණු 08)

05 i. මිහිඳු මහ රහතන් වහන්සේ සමඟ පැමිණි ධර්ම දූත පිරිස නම් කරන්න. (ලකුණු 03)

ii. ප්‍රථම ශ්‍රී ලාංකික භික්ෂුව හා භික්ෂුණිය නම් කරන්න. (ලකුණු 04)

iii. දුටුගැමුණු රජතුමාගෙන් බුදු සසුනට ඉටු වූ සේවය පිළිබඳ විස්තරයක් කරන්න. (ලකුණු 08)

06 i. පොළොන්නරු යුගයේ දී සොළීන්ගෙන් රට බේරාගත් පාලකයා නම් කරන්න. (ලකුණු 03)

ii. පොළොන්නරු යුගයට අයත් රැජිනක් හා රජවරු තිදෙනෙක් නම් කරන්න. (ලකුණු 04)

iii. ඔබ කැමති පොළොන්නරු පාලකයකුගෙන් සිදු වූ සේවය අගන්න. (ලකුණු 08)

07. පහත සඳහන් තුනක් පිළිබඳ කෙටි විස්තරයක් කරන්න.

i. වළගම්බා රජතුමා

ii. VI වන පරාක්‍රමබාහු රජතුමා

iii. II වන පරාක්‍රමබාහු රජතුමා

iv. අශෝක රජතුමා

(ලකුණු 5x3 = 15)